| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| **1.0**<br>අල් අකාඉද්<br><br>අකීදාව පිළිබඳව අවබෝධ කරගෙන ජීවිතය ක්‍රමවත් කරගනී. | 1.1<br>අකීදාවට අර්ථකථනයක් ලබාදෙයි. | ○ හැඳින්වීම<br>○ ව්‍යාතිරේඛය (පැහැදිලි කිරීම)<br><br>○ අඩංගු දෑ<br>▪ අල් -ඉලාහීයත්<br>▪ අර් රූහානියාත්<br>▪ අස්සම්ර්යාත්<br>▪ අන්නුබුවත් | • අකීදාව යනු කුමක්ද යන්න අර්ථකථනය කර දක්වයි.<br>• ඉස්ලාමීය අකීදාවෙහි අන්තර්ගතය විග්‍රහ කරයි.<br>• අහ්ලුස්සුන්නා වල් ජමාආවෙහි අකීදාව නිවැරැදිය යන්න පිළිබඳ කරුණු විස්තර කරයි.<br>• අහ්ලුස්සුන්නා වල් ජමාආවෙහි අකීදාව දේශනා කරයි. | 02 |
| | 1.2<br>ඊමාන් හා අමල් අතර ඇති සම්බන්ධතාවය හඳුනාගෙන පවසයි. | ○ ඊමාන් හා අමල්<br>○ ඊමාන් හා අමල් -පැහැදිලි කිරීම<br><br>○ ඊමාන් හා අමල් අතර ඇති සම්බන්ධතාවය<br><br>○ අල්කුර්ආනය හා සුන්නා මූලාශ්‍ර | • ඊමානයේ පුළුල් අදහස දූන පවසයි.<br>• වැරැදි විශ්වාසයන්ගෙන් ඉස්මතුවන්නාවූ අයහපත් ක්‍රියා හඳුනාගෙන පවසයි.<br>• යහ ක්‍රියාවන්ට හා යහ කල් ක්‍රියාවන්ට / යහ ගති පැවැතුම්වලට ස්ථිර වූ ඊමානය පමණක් හේතු සාධක වන බව සහතික වෙයි.<br>• ස්ථිර වූ ඊමානය මාර්ගයෙන් සමාජ ජීවිතයේ දී ආදර්ශමත් වෙයි. | 02 |
| | 1.3<br>රිසාලත් හා හිදායත් යන වචනවල පැහැදිලි කිරීම් ලැබ රිසාලතය හිදායතයක් සඳහා වූ මාර්ගය යැයි විස්තර කරයි. | • රිසාලත් හා හිදායත්<br>○ පද විවරණය<br>○ ව්‍යතිරේඛය (පැහැදිලි කිරීම)<br>○ රිසාලත් හිදායත් සඳහා වු මාර්ගයකි<br>○ රිසාලත්හි ඉතිහාසය | • රිසාලත් හා හිදායත් යන වචනවලට පැහැදිලි කිරීම් ලබා දෙයි.<br>• හිදායතය ලබාගැනීම සඳහා වූ මාර්ගය රිසාලතය පමණක් බව හේතු සාධක ඉදිරිපත් කරයි.<br>• නබි (සල්) තුමාණන් දේශනා කළ රිසාලතය ආරක්ෂා කිරීමට අපට ද වගකීමක් ඇත යන්න පිළිගෙන ක්‍රියා කරයි.<br>• අන් අය හිදායතය ලබාගැනීම සඳහා තමන්ට හැකි ආකාරයේ උත්සාහයන් දරයි. | 03 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 2.0<br>**අර්කානුල් ඉස්ලාම්**<br>ඉබාදත් පිළිබඳ විෂය කරුණු අවබෝධ කොටගෙන ජීවිතයම ඉබාදතයක් බවට පරිවර්තනය කරලීමට ඉබාදතයන් ක්‍රමානුකූලව, අඛණ්ඩව හා සැලකිලිමත්ව ඉටු කරයි. | 2.1<br>නජීස් ඉවත් කිරීමේ ක්‍රමය දැන එය සුපරීක්ෂාකාරීව පිළිපදියි. | • අත්තහාරා –<br>සාමාන්‍ය විවරණය<br>○ ජලයේ වර්ග<br>○ නජීස් වර්ග<br>○ නජීස් ඉවත් කර ගන්නා ක්‍රම<br>○ වුළූ<br>○ තයමුම්<br>○ ස්නානය | • ජල වර්ගීකරණය හා නජීස් ඉවත් කිරීමේ ක්‍රමය අවබෝධ කොට පිළිපදියි.<br>• වුළූ:, තයම්මුම්, නෑම හා සම්බන්ධවූ ඉස්ලාමීය ක්‍රමයන් දැන අන් අයටත් පැහැදිලි කරයි.<br>• ඉස්ලාම් පිරිසිදුකම සඳහා දී ඇති වැදගත්කම පැහැදිලි කරයි. | 02 |
| | 2.2<br>ඉබාදත් යන්න අවබෝධ කොට ගෙන ජීවිතයම ඉබාදතයක් ලෙස දක්නා ආකල්පය ඇති කරගනියි. | • අල් - ඉබාදා<br>○ ව්‍යතිරේඛය (පැහැදිලි කිරීම)<br>○ වර්ගයන්<br>○ කොන්දේසි | • ඉබාදත් යන්නෙහි තේරුම හා එහි භාවිතය ද ඉදිරිපත් කරයි.<br>• ලෞකික ක්‍රියාවක් ඉබාදතයක් ලෙස පරිවර්තනය කරගැනීමට වූ කොන්දේසි ලැයිස්තුගත කරයි.<br>• ඉබාදත් වර්ගීකරණය කර තිබෙන්නේ කෙසේදැයි පැහැදිලි කරයි.<br>• ඉබාදතයන් කෙසේ මිනිස් ජීවිතය යහ මඟට යොමු කරයි ද යන්න පිළිබඳ ව සොයා බලයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 2.3<br>සලාතයෙහි වැදගත්කම හා ඵල දැන සලාතය නො කඩවා ඉටු කරයි. | • සලාතය<br>○ එහි වැදගත්කම<br>• සිෆතුස් සලාත්<br>○ සලාත් කළ යුතු අයුරු | • සලාතය ඉස්ලාමයේ මූලික වගකීම්වලින් ඉතා වැදගත් බැව් සඳහන් වන සාක්ෂි ඉදිරිපත් කරයි.<br>• සලාතයෙහි වැදගත්කම සාක්ෂි සමඟ පැහැදිලි කරයි.<br>• සලාතයෙහි පාරායනාවන් දැන ඒවා වනපොත් කර පාරායනා කරයි.<br>• සලාතයෙහි සෑම අවස්ථාවක්ම දැන එහි පාරායනා කළ යුතු පාරායනාවන් ඉටු කරයි.<br>• සලාතය අත්හැර දැමීමෙන් ඇතිවන බලපෑම් දැන සලාතය අඛණ්ඩව ඉටු කරයි. | 03 |
| | 2.4<br>සලාතයෙන් පසුව කියනු ලබන පාරායනාවන් දැන ඒවා ඉටුකරයි. | ○ සලාතයේදී පාරායණය කළ යුතු දෑ<br>○ සලාතයෙන් පසුව පාරායණය කළ යුතු දෑ | • සලාතයට පසුව පාරායනා කළ යුතු අව්රාදයන් දැනකට පාඩම් කරයි.<br>• මෙසේ අව්රාදයන් පාරායනා කිරීමෙන් බොහෝ ආනිශංස ලැබේ යන්න පිළිගනියි.<br>• නබිතුමාණන් සලාතය ඉටු කිරීමෙන් අනතුරුව පාරායනා කළ දෑ අනෙක් අයටත් කියා දෙයි.<br>• එම අව්රාදයන්හි තේරුම දැන පාරායනා කරයි | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| **3.0**<br><br>**අල්අඛ්ලාක් වත්තස්කියා**<br><br>තස්කියා පිළිබඳ ව අවබෝධ කොට ගෙන ආධ්‍යාත්මික යහගුණයන් පවත්වා ගනියි. | 3.1<br><br>අත්තස්කියාව වටහාගෙන ඒ අනුව තම ජීවිතය පවත්වා ගනී. | • අත්තස්කියා හැඳින්වීම<br><br>○ තස්කියාවෙහි වැදගත්කම<br><br>○ අල්-කුර්ආන් සුන්නා මූලාශ්‍ර තහවුරු කිරීම | • අත්තස්කියා යනු කුමක් ද යන්න අවබෝධ කරගනියි.<br>• අත්තස්කියාවෙහි වැදගත්කම සොයා බලයි.<br>• අත්තස්කියාවෙහි අරමුණ පැහැදිලි කරයි.<br>• අත්තස්කියා යන්න ඇති කරගැනීමට අදාළ ක්‍රියාකාරකම් පිළිපදියි. | 02 |
| | 3.2<br><br>යහගුණ පිළිබඳ ව ඉස්ලාමීය දෘෂ්ටිකෝණය දැන ඒවා පිළිපදියි. | • යහපත් ගුණාංගයන් පිළිබඳ ඉස්ලාමීය දැක්ම<br><br>○ ආදරය<br><br>○ දන්දීම<br><br>○ පරිත්‍යාගය<br><br>○ අවංක බව<br><br>• ඉන්ද්‍රිය පාලනය | • යහගුණයන් හට ඉස්ලාම් ලබා දී ඇති වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• යහ ගුණධර්මවලට ආදර්ශයක් වූ නබි (සල්) තුමාණන්ගේ ජීවිතය දැන ප්‍රකාශ කරයි.<br>• ආදරය, දානය, පරිත්‍යාගය, අවංකභාවය, යනාදියට ඉස්ලාම් ලබා දී ඇති වැදගත්කම දැන ප්‍රකාශ කරයි.<br>• පංචේන්ද්‍රිය පාලනය කොට ගෙන ජීවිතය යහමඟට හරවයි. | 02 |
| | 3.2 යහගුණ පිළිබඳ ව ඉස්ලාමීය දෘෂ්ටිකෝණය දැන ඒවා පිළිපදියි. | • අධ්‍යාත්මික දියුණුව සඳහා වු ක්‍රමවේදයන්<br><br>○ ඉඛ්ලාස්<br><br>○ තව්බා<br><br>○ වරඋ<br><br>○ සුහ්ද් | | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| **4.0**<br>**මෂාතිරුශ් ෂරීආ** ඉස්ලාමයේ මූලාශ්‍රයන් පිළිබඳ පැහැදිලි දැනුම ලබා ඒ අනුව ජීවන ක්‍රමය සකස් කර ගනියි. | 4.1<br>වහිවල වැදගත්කම වටහාගෙන එය ගෙනහැර දක්වයි | • වහී හැඳින්වීම<br>• වහී වැදගත්කම | • වහී යන්නෙහි අර්ථකතනය පවසයි.<br>• මිනිස් දැනුම හා වහී අතර වෙනස්කම් දැන පවසයි.<br>• වහීවල වැදගත්කම දැන එහි උපදේශයන් අනුගමනය කරයි.<br>• වහී පහළ කරනු ලැබූ ආකාරය හා එහි වර්ගයන් ගොනු කර පවසයි. | 02 |
| | 4.2<br>අල් කුර්ආනය පහළ කරනු ලැබ, ගොනු කළ ඉතිහාසය විස්තරාත්මකව පවසයි | • අල් කුර්ආන්<br>○ පහළ වීම<br>○ ග්‍රන්ථාරූඪ වීම | • දෙව්ලොවින් නබි (සල්) තුමා වෙත අල්කුර්ආනය පහළ කරනු ලැබූ පියවර දැන එය පවසයි.<br>• අල්කුර්ආනය කොටස් වශයෙන් පහළ කරනු ලැබීමට හේතු දැන එය විස්තර කරයි.<br>• අල්කුර්ආනය ආරක්ෂා කරනු ලැබූ ඉතිහාසය දැන එය ආරක්ෂා කිරීමේ වෑයමෙහි යෙදෙයි<br>• නබි (සල්) තුමාගේ කාලයේ අල්කුර්ආනය ආරක්ෂා කරනු ලැබූ ආකාරය දැන පවසයි.<br>• නබි (සල්) තුමාගේ කාලයේ අල්කුර්ආනය ආරක්ෂා කරනු ලැබූ ආකාරය දැන පවසයි.<br>• අබූබක්ර් (රළි), උස්මාන් (රළි) කාලවල අල්කුර්ආන් ගොනු කළ ආකාරයන්ගේ වෙනස්කම් දැන පවසයි.<br>• නබි (සල්) තුමාගේ කාලයේ අල්කුර්ආනය ආරක්ෂා කරනු ලැබූ ආකාරය දැන පවසයි | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 4.3 සුන්නා හි වැදගත්කම වටහා ගෙන සාධක සමග ඉදිරිපත් කරයි | • සුන්නා --- වැදගත්කම | • සුන්නා ව දැන එහි අවශ්‍යතාවය සාධක සමග ඉදිරිපත් කරයි.<br>• ඉස්ලාමය ක්‍රියාත්මක කිරීමට සුන්නා අවශ්‍ය බව පිළිගනියි.<br>• සුන්නා හි වැදගත්කම වටහාගෙන එය සිය ජීවිතයේ අනුගමනය කරයි. | 02 |
| | 4.4 ද්විතීය මූලාශ්‍රයන්වන ඉජ්මා, කියාස්, ආදියෙහි ප්‍රයෝජන පැහැදිලි කර කියයි. | • සහාය මූලාශ්‍රයන්<br>• ඉජ්මා -- කියාස්<br>○ අනෙකුත් සහය මූලාශ්‍රයන් | • නවීන ගැටලු විසැඳීමට ඉජ්මා සහ කියාස් වැදගත්වන බව පවසයි.<br>• ඉජ්තිහාද් වර්ධනයට ඉජ්මා හා කියාස් අවශ්‍ය බව පිළිගනියි.<br>• ඉජ්මා හා කියාස් පදනම් කර ලබාගත් විසඳුම් ඒවා අන් අයට ද පවසයි.<br>• ඉජ්මා හා කියාස් අතර වෙනස්කම් ගෙන හැර දක්වයි. | 02 |
| **5.0**<br>නබි (සල්) තුමාගේත් කුලෆාඋර් රාශිදුන්වරුන්ගේ ජීවන ක්‍රමය වටහා ගැනීම සහ | 5.1 ඉස්ලාමයට පූර්වකාලීන සමාජයේ ඉතිහාසය පැහැදිලි ව පවසයි. | • ඉස්ලාමයට පෙර අවධිය | • ඉස්ලාමයට පෙර අරාබියේ සමාජ තත්ත්වය ගැන පවසයි.<br>• ඉස්ලාමයට පෙර අරාබියේ ආගමික තත්ත්වය පසුකාලින තත්ත්වය සමඟ සසඳයි.<br>• ඉස්ලාමයට පෙර අරාබියේ පවුල් ව්‍යුහය ඉස්ලාමය සමඟ සසඳයි.<br>• ඉස්ලාමයට පෙර අරාබියේ අරාබි භාෂාවට හිමි තත්ත්වය ගැන පවසයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| ලාංකික මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය සහ ඔවුන්ගේ ජාතික දායකත්වය විස්තරාත්මකව අවබෝධ කරගෙන අන් අයට ද පවසයි. | 5.2<br>ඉස්ලාම ආගමේ පැමිණීම නිසා ඇති වු සමාජ වෙනස්කම් විස්තර කරයි | • නබි (සල්) තුමාගේ පැමිණීමෙන් පසු ඇති වූ සමාජ වෙනස | • සමාජ වෙනස්කම අනිවාර්ය බව වටහාගෙන පවසයි.<br>• සමාජ වෙනස්කම සිදුවන ක්‍රියාපිළිවෙළ ගෙන හැර දක්වයි.<br>• ඉස්ලාම් කෙසේ සමාජ වෙනස්කම් ඇති කළා ද යන්න ලැයිස්තු ගත කරයි. | 02 |
| | 5.3<br>මක්කම හා මදීනා කාලයේ දෑවා ඉතිහාසය හා මුහුණ දුන් අභියෝගයන් පහදා කියයි. | • නබි (සල්) තුමාගේ දෑවාව හා එහිදී මුහුණදීමට සිදුවු අභියෝග | • නබි (සල්) තුමාගේ දෑවා ක්‍රමය පැහැදිලි කරයි.<br>• නබි (සල්) තුමා සහ මුල්කාලින මුස්ලිම්වරු දෑවා අවස්ථාවේදී මුහුණ දුන් අභියෝග හඳුනාගෙන පැහැදිලි කරයි.<br>• මක්කා දෑවාව සහ මදීනාවේ දෑවා ව වෙනස්වන අකාරය තර්කානුකූලව ඉදිරිපත් කරයි.<br>• නබි (සල්) තුමාගේ යුද්ධ කාලීන අත්දැකීම් පාඩමක් වශයෙන් ගනියි.<br>• නබි (සල්) තුමා ඇති කරගත් ගිවිසුම්වල ආදර්ශයන් පූර්වාදර්ශය වශයෙන් ගනියි.<br>• නබි (සල්) තුමන් කළ ගිවිසුම්වල ආකෘතීන් ආදර්ශ ලෙස ගෙන ක්‍රියාකරයි. | 02 |
| | 5.4<br>සීරාහි වැදගත්කම තේරුම්ගෙන ගෙනහැර දක්වයි. | • සීරාහි වැදගත්කම | • සීරාහි වැදගත්කම ගෙනහැර දක්වයි.<br>• සීරාව සුවිශේෂී කලාවක්වේය යන්න ඔප්පු කර පෙන්වයි.<br>• සීරාවෙහි ආදර්ශයන් ඉගෙනීමේ වැදගත්කම විස්තර කරයි.<br>• සීරාව නොයෙකුත් දෘෂ්ටිකෝණයන්ගෙන් ගෙනහැර දක්වයි. | 01 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| **6.0 අල්මුආමලාත්**<br>ආර්ථිකය සම්බන්ධයෙන් ඉස්ලාමීය ඉගැන්වීම් ද පවුල් ජීවිතය සම්බන්ධයෙන් ඉස්ලාමීය අර්ථය වටහාගෙන ඒවා පිළිපදිනු ඇත. | 6.1<br>ආර්ථිකය පිළිබඳ ඉස්ලාමීය දැක්ම අවබෝධ කර ඉස්ලාමීය ක්‍රමයට ඒවා ක්‍රියාවට නංවයි. | • ආර්ථිකය පිළිබඳ ඉස්ලාමීය දැක්ම. | • ඉස්ලාම් ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයට මගපෙන්වන්නාවූ විලාශය විස්තර කරයි.<br>• ඉස්ලාමීය ආර්ථිකය පිළිබඳ ව කියාපාන්නාවූ අල්කුර්ආන් වාක්‍ය හා හදීසයන් දක්‍ව පවසයි.<br>• ඉස්ලාමීය ආර්ථිකයේ සුවිශේෂී ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• ඉස්ලාමීය ඉපැයීමෙහි සීමාවන් අවබෝධ කර ඉදිරිපත් කරයි. | 02 |
| | 6.2<br>ඉපැයීමෙහි වැදගත්කම අවබෝධ කර ඉස්ලාමීය ක්‍රමයට ඒවා ක්‍රියාවට නංවයි. | • ඉපැයීමෙහි වැදගත්කම | • ඉපැයීමෙහි වැදගත්කම අවබෝධ කර විස්තර කරයි.<br>• ඉපැයීමෙහි වැදගත්කම කුර්ආන් හා හදීස් අනුසාරයෙන් විග්‍රහ කරයි.<br>• උපයා ජීවත්විය යුතුය යන හැඟීමෙන් ක්‍රියා කරයි.<br>• කිසිම අවස්ථාවක සිඟා කා ජීවත් නොවිය යුතුය යන හැඟීමෙන් ජීවත් වෙයි. | 02 |
| | 6.3<br>මහන්සි වී වැඩකිරීමෙහි වැදගත්කම අවබෝධ කර ඉස්ලාමීය ක්‍රමයට ඒවා ක්‍රියාවට නංවයි. | • ව්‍යාපාරය | • ඉස්ලාමීය ව්‍යාපාරය පිළිබඳ අවබෝධ කර විස්තර කරයි.<br>• අවංක වෙළෙන්දන්ට පරලොව දී ලැබෙන්නාවූ භාග්‍යයන් පිළිබඳ ව අවබෝධ කර අන් අයට ගෙනහැර දක්වයි.<br>• ගනුදෙනුවල දී අවංකභාවය පිළිපැද ක්‍රියා කරයි. | 01 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 6.4<br><br>මහන්සි වී වැඩකිරීමෙහි වැදගත්කම අවබෝධ කර ඉස්ලාමීය ක්‍රමයට ඒවා ක්‍රියාවට නංවයි. | • කෘෂිකර්මය<br><br>• කර්මාන්ත | • කෘෂිකර්මාන්තයට හා කර්මාන්තයට ඉස්ලාම් ලබා දී ඇත්තාවූ වැදගත්කම් අවබෝධ කර විස්තර කරයි.<br>• නබිවරුන් කෘෂිකර්මාන්ත හා කර්මාන්ත කටයුතුවල නියැලුණ බව අවබෝධ කර ඒවා ලැයිස්තුගත කරයි.<br>• කෘෂිකර්මාන්තය හා කර්මාන්ත ආදියෙහි නියැලීම නිසා ඇතිවන්නාවූ ප්‍රතිඵල ගෙනහැර දක්වයි.<br>• රැකියාවන් හා කම්කරුවන්ව ගරු කරයි. | 02 |
| | 6.5<br><br>මහන්සි වී වැඩකිරීමෙහි වැදගත්කම අවබෝධ කර ඉස්ලාමීය ක්‍රමයට ඒවා ක්‍රියාවට නංවයි. | • සේවාවන් | • නොයෙකුත් සේවා හා සම්බන්ධ රැකියා පිළිබඳ දැන ඒවා ලැයිස්තුගත කරයි.<br>• සේවා හා සම්බන්ධ රැකියාවන්හි අමානතය රැකිය යුතු බව පිළිගෙන පිළිපදියි.<br>• සේවා හා සම්බන්ධ රැකියාවෙහි නියැලෙන්නන් නමින් දරන්නාවූ වගකීම් හා තනතුරු සම්බන්ධ ව පරලොවෙහි දී අල්ලාහ්ට පිළිතුරු දිය යුතුය. යන්න අවබෝධ කර ක්‍රියාකළ යුතුය යන චේතනාව ඇතිව ක්‍රියාකරයි.<br>• සේවා හා සම්බන්ධ රැකියාවන්හි යෙදෙන්නන්ට ගෞරව කරයි. | 01 |
| | 6.6<br><br>අජ්නබි - මහ්රම් නීතිරීතීන් රැක පිළිපදියි. | • අජ්නබි - මහ්රම් සීමාව | • අජ්නබි – මහ්රම් නීතිරීති පිළිබඳ ව වටහාගෙන විස්තර කරයි.<br>• විවාහ වීමට තහනම් කළ පුද්ගලයන් පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි.<br>• තනි පුද්ගල, පවුල්, සාමූහික ජීවිතයේ අජ්නබි – මහ්රම් නීතිරීති පිළිපැදිය යුතු බව වටහා ක්‍රියා කරයි.<br>• අජ්නබි – මහ්රම් නීතිරීති පිළිනොපැදීමෙහි ආදීනව වටහා ක්‍රියා කරයි.<br>• අජ්නබි – මහ්රම් නීතිරීති රැක ඒ අනුව ක්‍රියා කරයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 7.0<br>**අල්මපාහිමුල් ඉස්ලාමීයා**<br>එක් එක් අංශයන් සම්බන්ධයෙන් ඉස්ලාමයටම වු අනන්‍ය දැක්මක් තිබෙන බව වටහාගෙන කටයුතු කරයි. | 7.1<br>තාරුණ්‍යයේ වැදගත්කම වටහා ගෙන ඒ අනුව කටයුතු කරයි. | • යෞවනයන් හා ඔවුන්ගෙන් අපේක්ෂිත සේවාවන් | • තාරුණ්‍යයයේ වැදගත්කම වටහා ගෙන ඒ අනුව කටයුතු කරයි.<br>• තාරුණ්‍යයයේ ගුණාංග, දක්ෂතා හා හැකියාවන් වටහා ගෙන පවසයි.<br>• තාරුණ්‍යයයේ කළ යුතු යුතුකම් දැන ඒ අනුව කටයුතු කරයි.<br>• අවසාන දිනයේ දී තාරුණ්‍යය ගත කළේ කෙසේ ද යන්න අල්ලාහ් විමසනු ලබන්නේය යන්න දැන ඒ අනුව කටයුතු කරයි. | 01 |
| | 7.2<br>කායික හා මානසික සුවය පිළිබඳ ව ඉස්ලාමීය දෘෂ්ටිකෝණය විස්තර කොට තමන්ව ඊට පුහුණු කර ගනියි. | • ශාරීරික හා මානසික සෞඛ්‍යය | • කායික හා මානසික සුවය ඇති කර ගන්නේ කෙසේදැයි හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• කායික හා මානසික සුවය නැති කරන කරුණු හඳුනාගෙන එයින් වැළකී ක්‍රියා කරයි.<br>• ගත මෙන්ම සිත ද සුවයෙන් තබා ගත යුතුය යන්න දැන ප්‍රකාශ කරයි.<br>• කායික හා මානසික සුවය පරලොවෙහි ජය ළඟා කර ගැනීමට තුඩු දේ යන්න වටහා ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 01 |
| | 7.3<br>ඉස්ලාමයේ මධ්‍යම ප්‍රතිපදාවෙන් සිටීමේ අවශ්‍යතාවය වටහාගෙන එය ජීවිතයේ අනුගමනය කරයි. | • මධ්‍යස්ථ බව | • මධ්‍යස්ථව සිටීමේ වැදගත්කම වටහා ඒ අනුව ක්‍රියා කරයි.<br>• මධ්‍යස්ථව සිටීමෙන් ඇති වන යහපත් ප්‍රතිඵල දැනගෙන ප්‍රකාශ කරයි.<br>• මධ්‍යස්ථව නොසිටීමෙන් ඇති වන බලපෑම් පිළිබඳ ව සැලකිලිමත්ව ක්‍රියා කරයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 7.4<br>ෆික්හුල් අව්ලවියියාත් යන විෂය කරුණු වටහා ගෙන සිය ජීවිතයෙහි ක්‍රියාත්මක කරයි. | • ෆික්හුල් අව්ලවිය්යාත් | • සිය ජීවිතයෙහි ප්‍රමුඛත්වය ලබා දිය යුතු කරුණු හඳුනා ප්‍රකාශ කරයි.<br>• එදිනෙදා ජීවිතයෙහි සෑම කරුණක් ම නිරවුල්ව තිබිය යුතු යන්න වටහා ක්‍රියා කරයි.<br>• ජීවිතයෙහි නොයෙක් කරුණුවල මුල් තැන දීමේ හැකියාව ලබා ඒ අනුව ක්‍රියා කරයි.<br>• ප්‍රමුඛතාවය ලබාදීම මඟින් තනි පුද්ගල හා සාමාජීය යහපත රැක ගනු ලබයි යන්න රැක ගෙන ක්‍රියා කරයි. | 02 |
| | 7.5<br>ඉස්ලාම් ලබා දී ඇති මානව අයිතිවාසිකම් සාධක සහිත ව විස්තර කරයි. | • මානව අයිතිවාසිකම් | • ඉස්ලාමීය දෘෂ්ටිකෝණයේ මානව අයිතීන් යනු අල්ලාහ්ගේ අණ යනු වටහා ගෙන ප්‍රකාශ කරයි.<br>• මානව අයිතීන් රැක ගැනීමේ වැදගත්කම නබි (සල්) තුමාණන්ගේ ආදර්ශ මගින් පැහැදිලි කරයි.<br>• ලොවේ වසන සෑම ජීවියෙකුටම අයිතීන් ඇති බව ගරු කර ඒ අනුව ක්‍රියා කරයි. | 02 |